පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය: 06

# අවසාන වාර පරීක්ෂණය - 2022

## සිංහල භාෂාව හා සාහිත්‍යය I, II

පාසලේ නම : ......................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 02 යි

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පහත සඳහන් පද අතුරෙන් **අල්පප්‍රාණ අකුරු** පමණක් යෙදී ඇති වචනය තෝරන්න.
    i. භාග්‍ය ii. පඳුර
    iii. සාධකය iv. ග්‍රන්ථය

02. පහත පද අතුරෙන් **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පදය තෝරන්න.
    i. වේදය ii. ප්‍රාර්ථණා
    iii. අන්ධකාරය iv. දියවල

03. 'රුවන්' යන පදයට **සමානාර්ථයක්** දෙන පදය තෝරන්න.
    i. මැණික් ii. රත්‍රං
    iii. කළුගල් iv. රිදී

04. 'දිළිඳු' යන පදයට **විරුද්ධාර්ථයක්** දෙන පදය තෝරන්න.
    i. බබළන ii. බිළිඳු
    iii. දුප්පත් iv. පොහොසත්

05. පහත සඳහන් නාම පද අතුරෙන් **උක්ත** නාම පදය තෝරන්න.
    i. ගොවියෝ ii. කවියෙකු
    iii. බිසවක iv. ළමයින්

06. පහත සඳහන් ක්‍රියා පද අතුරෙන් **වර්තමාන කාල ක්‍රියා පදය** තෝරන්න.
    i. නැටූහ ii. දුවති
    iii. ලිවුවා ය iv. කළේ ය

07. පහත සඳහන් පද අතුරෙන් **ප්‍රථම පුරුෂ බහු වචනය** වන්නේ,
    i. මම ii. අපි
    iii. නුඹ iv. ඔවුහු

08. පහත දැක්වෙන වාක්‍යයේ ඇතුළත් **නාම විශේෂණ පදය** තෝරන්න.
    **'ශිෂ්‍ය ශිෂ්‍යාවෝ පිරිසිදු ඇඳුම් ඇඳගෙන පාසල් පැමිණෙති'**
    i. ඇඳුම් ii. පාසල්
    iii. පිරිසිදු iv. එති

09. පහත සඳහන් පද අතුරෙන් **ස්ත්‍රී ලිංග බහු වචන පදය** වන්නේ,
    i. කිරිල්ලියෝ ii. දූරියක්
    iii. මගීහු iv. ගුරුවරියක්

10. සඤ්ඤක අක්ෂරයක් යෙදී **නොමැති** වචනය තෝරන්න.
    i. අඳ ii. වෙළඹ
    iii. වෙරළු iv. සඟ

- අංක 11 සහ 12 ප්‍රශ්නවල හිස්තැන්වලට ගැළපෙන වචනය තෝරන්න.

11. .......................... සිල් සමාදන් වෙති.

i. උපාසිකාව ii. උපාසිකාවක්
iii. උපාසිකාවෝ iv. උපාසිකාවන්

12. සිංහයා .......................... පසුපස හඹා ගියේ ය.

i. මුවෝ ii. මුවෙක්
iii. මුවදෙනක් iv. මුවන්

- අංක 13 සහ 14 ප්‍රශ්නවල ආඛ්‍යාතය සඳහා ගැළපෙන **ක්‍රියා පදය** තෝරන්න.

13. ඈ අසරණයින්ට පිහිට ................................

i. වූවේ ය ii. වූවා ය
iii. වූහ iv. වෙති

14. නුඹලා ඊයේ දින ගමට ..........................

i. යති ii. ගියෙහු
iii. ගියහ iv. යන්නෙහු

15. පහත වාක්‍යයේ යෙදී ඇති **විරාම ලක්ෂණය** කුමක්දැ'යි තෝරන්න.

**සියලු ලෝක සත්ත්වයෝ නිදුක් වෙත්වා !**

i. විශ්මයාදී ලකුණ ii. ප්‍රශ්නාර්ථ ලකුණ
iii. තිත iv. තිත් කොමාව

16. **ඇවිදින කොළයා** පාඩම උපුටාගන්නා ලද කෘතිය වන්නේ,

i. එදා හෙළදිව ii. මග දිගට ජනකතා
iii. විද්‍යා විනෝද කතා iv. අපේ ගම

17. **ගුත්තිල කාව්‍යයේ** රචකයා වන්නේ,

i. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ii. ඇම්.ඇල්.සිල්වා ගුරු මුහන්දිරම්තුමා
iii. අභය හේවාවසම් මහතා iv. වෑත්තෑවේ හිමි

- අංක 18 සහ 19 ප්‍රශ්නවල **ඉරි ඇඳි පදයේ අර්ථය** දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

18. උදසන සවසඳ
පහන් දල්වව **<u>විමන</u>** නො වරද

i. පාසල ii. වීදිය
iii. පන්සල iv. නිවස

19. "වහා ආපසු හැරී යනු මැනවැ'යි ඉතා **<u>ශික්ෂිතව</u>** දැනුම් දුන්නේ ය."

i. කෝපයෙන් ii. වේගයෙන්
iii. හික්මීමෙන් iv. ආදරයෙන්

20. පහත කවියේ **හතරවන පේළිය** සඳහා යෙදෙන පද්‍ය පාඨය තෝරන්න.

වනේ ගිජිඳු ය දුටුවොත් වනසා ය
ළිඳේ පණිඳු ය වැටුනොත් ඌ කා ය
අතකින් කරවැලෙකි අතකින් දඬුබෑ ය
..........................................................................

i. මරණ හතක් ඇති මිනිසෙක් පැණි කෑ ය
ii. මරණ තුනක් ඇති මිනිසෙක් පැණි කෑ ය
iii. මරණ හතක් ඇති මිනිසෙක් බත් කෑ ය
iv. මරණ තුනක් ඇති මිනිසෙක් බත් කෑ ය

( ලකුණු 2 x 20 = 40 )

# II කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් මාතෘකා අතරෙන් එකක් තෝරාගෙන වචන **100 කට නො අඩුවන** සේ රචනයක් ලියන්න.

i. මිහිකත සුරකින තුරුලිය

ii. ජල සම්පත රැක ගනිමු

iii. අපේ අතීත රජ දරුවෝ

iv. සාරධර්ම පිළිපදිමු

( ලකුණු 20 )

02. පෙළපොතෙහි එන පාඩම් ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. "කිමෙක් ද ? දරුවෙනි, පැන් නොබොවූ දූ'යි"

( අ ) මෙම ප්‍රකාශය ඇතුළත් ජාතක කතාව කුමක් ද?

( ආ ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?

( ඉ ) මෙම ප්‍රකාශය කළේ කා හට ද?

ii. "තොප වැනි රාජ සේවකයන් ඇති මම ආඩම්බර වෙමි"

( අ ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින් ද?

( ආ ) මෙම ප්‍රකාශය කළේ කා හට ද?

( ඉ ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?

iii. කැමට කැදරකම් නො කරන්නේ
තව මට කියමින් කෑ නො ගසන්නේ
තරහට කැමක් විසි නො කරන්නේ
..........................................................................

( අ ) මෙම කවියේ හතරවන කවි පේළිය සම්පූර්ණ කරන්න.

( ආ ) මෙම කවිය ඇතුළත් කාව්‍ය කෘතිය කුමක් ද?

( ඉ ) එම කෘතියේ රචකයා කවුරුන් ද?

iv. "ඒ සතාගේ මහත තමා මහත. එතරම් දිග ශරීරයක් ඇදෙන කලැ අහස පොළොව දෙදෑරීම පුදුමයක් නොවේ"

( අ ) මේ පුදුම සහගත සතා කවුරුන් ද?

( ආ ) මෙම පාඨය ඇතුළත් පාඩම කුමක් ද?

( ඉ ) මෙය උපුටාගත් කෘතියේ රචකයා කවුරුන් ද?

v. "මෙරටෙහි තවත් මනවඩන ආහාරයක් නම් පිට්ටු ය"

( අ ) මෙම පාඨය ඇතුළත් පාඩම කුමක් ද?

( ආ ) මෙම පාඩමට තොරතුරු සපයාගෙන ඇත්තේ කුමන කෘතියෙන් ද?

( ඉ ) මෙම පාඩමට අනුව බත්වලට අමතරව එකල ජනයාගේ ප්‍රධාන ආහාරය වූයේ කුමක් ද?

( ලකුණු 3 x 5 = 15 )

03. පහත සඳහන් පැදිපෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දිය ඇලි ගංගා ගලා බසින්නේ
රන්වන් ගොයමින් කෙත දිලිසෙන්නේ
මල් පිපිලා මුලු ලොව බබළන්නේ
සොබාදහමෙ අසිරියයි පෙනෙන්නේ

පුංචි සමනල්ලු එහෙ මෙහ පියඹන්නේ
හිරු පායා ලොව එළිය වැටෙන්නේ
සිසිල් සුළං ඇඟ වැදෙමින් යන්නේ
සොබාදහමෙ අසිරියයි පෙනෙන්නේ

හිරු අද දවසින් සමුගෙන යන්නේ
නව සඳ ඉන්පසු අහසට එන්නේ
පුංචි ළමෝ දූන් නින්දට යන්නේ
සොබාදහමේ සුවයයි මෙ විඳින්නේ

i. මෙම කවි පෙළින් කියැවෙන්නේ කුමක් පිළිබඳව ද?

ii. මුලු ලොව බබළන්නේ කුමක් හේතුවෙන් ද?

iii. හිරු සමුගෙන යන විට ඒ වෙනුවට එන්නේ කවුරුන් ද?

iv. මෙම කවි පෙළෙහි දක්වෙන උක්ත බහුවචන 02ක් ලියන්න.

v. පහත සඳහන් පදවලට සමාන පද එක බැගින් කවි පෙළෙන් උපුටා ලියන්න.

( අ ) කුඹුර

( ආ ) තරිඳු

( ලකුණු 2 x 05 = 10 )

04. ඔබගේ හොඳම මිතුරා / මිතුරිය පද්‍ය ගායනා ඉසව්වෙන් සමස්ත ලංකා තරඟයට මුහුණ දීමට සුදුසුකම් ලබා ඇත. ඔහුට/ඇයට සුබපතමින් නිර්මාණාත්මක **සුබ පැතුම්පතක්** සකස් කරන්න.

නැතහොත්

ඔබගේ එකොළොස්වන උපන්දින උත්සවය ලබන මස 15 වන දින පැවැත්වෙන අතර ඒ සඳහා තම නිවසට පැමිණෙන ලෙස පවසමින් තම ඥාති සොහායුරා/ සොහොයුරියට යවන **පෞද්ගලික ලිපිය** ලියන්න.

( ලකුණු 15 )

**තුන්වන වාර පරීක්ෂණය - 2022**

**06 ශ්‍රේණිය - සිංහල**

**පිළිතුරු පත්‍රය**

**I කොටස**

| | |
|---|---|
| 01 - 2 | 11 - 3 |
| 02 - 3 | 12 - 4 |
| 03 - 1 | 13 - 2 |
| 04 - 3 | 14 - 2 |
| 05 - 1 | 15 - 1 |
| 06 - 2 | 16 - 3 |
| 07 - 4 | 17 - 4 |
| 08 - 3 | 18 - 4 |
| 09 - 1 | 19 - 3 |
| 10 - 3 | 20 - 2 |

( ලකුණු 2 X 20 = 40 )

**II කොටස**

01. රචනය - ( ලකුණු 20 )

02. I i නලපාන ජාතකය

Ii බෝධිසත්වයෝ / වඳුරු නායකයා

Iii සෙසු වඳුරන්ට

II i දෙවන රාජසිංහ රජු / රාසිං දෙයියෝ

Ii හවඩියා නම් මුරකරු

Iii රාසිං දෙයියන්ට බැණ වැදුණු මුරකරුවා

III i එළිපිට හිටගෙන කෑම නො කන්නේ

Ii සිරිත් මල්දම

Iii ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම්තුමා

IV i දුම්රිය / කෝච්චිය

Ii අලි උවදුර

Iii කුමාරතුංග මුනිදාස

V i අග්ගලා කං ඩෝං පුතා

Ii එදා හෙළදිව

Iii කොස් ( ලකුණු 3 X 5 = 15 )

03. I සොබාදහමේ අසිරිය

II මල් පිපීමෙන්

III නව සඳ

IV සමනල්ලු, ළමෝ

V කුඹුර - කෙත තරිඳු - සඳ ( ලකුණු 2 X 5 = 10 )

04. සුබ පැතුම් පත හෝ පෞද්ගලික ලිපිය ( ලකුණු 15 )

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**